# පුරප්පාඩු

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

## බලශක්ති අමාත්‍යාංශය

පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර - තාක්ෂණ නිලධාරී (JM 1-2), තනතුරු -02**

- **සුදුසුකම්**

<u>**බාහිර අයදුම්කරුවන්**</u>

01. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාමරීක/ වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් පහත කේෂ්ත්‍රවලින් එකක NVQ 07 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

02. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාමරීක/ වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් පහත කේෂ්ත්‍රවලින් එකක NVQ 06 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාල කේෂ්ත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05ක පශ්වාත් සුදුසුකම් පළපුරුද්ද

**හෝ**

03. තෘතික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තිය පුහුණු ආයතනයකින් ලබාගත් පහත කේෂ්ත්‍ර වලින් එකක (NVQ) 5 නොඅඩු සහතිකයක් හෝ ප්‍රවිණතාවයක් ලබා ගැනීම

**සහ**

සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාල කේෂ්ත්‍රයේ අවම වශයෙන් අවුරුදු 10ක පශ්වාත් සුදුසුකම් පළපුරුද්ද

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන්**</u>

01. ඉහත බාහිර සුදුසුකම් සපුරා තිබීම

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන II ශ්‍රේණියේ සතුටුදායක සේවා පළපුරුද්ද.

- **කේෂ්ත්‍රය**

තොරතුරු තාක්ෂණ (IT ), සන්නිවේදන තොරතුරු තාක්ෂණ (ICT) හෝ ඉලෙක්ට්‍රොනික්

- **වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවු.22ට නොඅඩු සහ අවු. 45ට නොවැඩි විය යුතුය.

- **වැටුප් පරිමාණය**

රු. Rs.74 ,010-/,1360 /- x10, 2,040/- x 18 - 124,330/-

වැටුප

2025.01.01 දිනට මූලික වැටුප රු. 59,552/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව )

- **පොදු කොන්දේසි**

  01. ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.
  02. තනතුරේ රාජකාරී ඉටුකිරීමට හා රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය වීම
  03. විශිෂ්ඨ චරිතයකින් සමන්විත විය යුතු වීම.

- **බඳවා ගැනීමේ ක්‍රමය**

  තරගකාරී ලිඛිත විභාගය සහ/හෝ ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයක් මගින්

**අයදුම්කරුවන් සඳහා පොදු අවශ්‍යතා**

- ශ්‍රී ලංකා පුරවැසියකු වීම
- තනතුරේ රාජකාරී ඉටුකිරීමට හා රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම හැකි වීම
- කායිකව හා මානසිකව යෝග්‍ය වීම
- විශිෂ්ඨ චරිතයකින් සමන්විත විය යුතු වීම

**අයදුම් කිරීම**

තනතුරට අදාල සුදුසුකම් සහ අනෙකුත් විස්තර සමඟ අයදුම්පත් ආකෘති පත්‍රය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ www.aerc.gov.lk වෙබ් අඩවියෙහි සඳහන් කර ඇත. නියමිත ආකෘති පත්‍රයට අනුව සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිදෙර්ශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් විස්තර සහිතව සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතිකපත්වල ඡායා පිටපත් සමඟ 2025.10.31 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතු අතර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වන්නේ නම් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන්ගේ මාගර්යෙන් ඉදිරිපත් කළ යුතු ය.

සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
977/18, නුවර පාර, බුලුගහ හංදිය, කැලණිය.

දුරකථන අංක - 011- 2987860, 011-2987859, 011-2987857
වෙබ් අඩවිය - www.aerc.gov.lk